**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව - 2020**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍යප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.500,000 ක ඉදිකිරීම්වල වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජ'ර්නල් සටහන් තබා එය නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | සභාව සතුව පැවති ට්‍රැක්ටරයෙහි වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම්ගතකර නොතිබුණි. | මෙය මහවැලියට ආපසු භාර දීමට කටයුතු කරමින් පවතින අතර, එබැවින් එහි වටිනාකම ගිණුම් ගත නොකරන ලදී. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ දී පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබූ රු.6,221,374 ක් පිරිවැය වූ කම්පැක්ටරය හා පරිත්‍යාගයක් ලෙස ලද ට්‍රැක්ටර් ටේලරයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | ජර්නල් සටහන් තබා එය නිවැරදි කිරීමට හා ට්‍රැක්ටර් ටේලරය වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඈ) | කුණ්ඩසාලේ හා පාතදුම්බර ප්‍රාදේශීය සභා දෙක ගිවිසුමක් යටතේ පවත්වාගෙන යන අළුත්වත්ත කොම්පෝස්ට් අංගනය ව්‍යාපෘතියේ ආදායම හා වියදම ඇතුළත් කරමින් වෙනම ගිණුමක් පිළියෙල කර, සභාවට අදාළ ලාභය පමණක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වුවත් සමස්ත ආදායම හා වියදම ගිණුම්ගත කිරීමෙන් සභාවේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | ආදායම් වියදම් ගිණුමක් සකස් කර එහි නිවැරදිතාවය පරීක්ෂා කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලට අදාළ උපලේඛනවල ඇතුළත් ගිණුම් විෂයයන් 03 ක ශේෂයන් හා උපයෝගී පොත්වල දැක්වෙන ශේෂයන් අතර රු.2,803,012 ක නොසැසඳීම් පැවතුණි. | නොසැසඳීම්වලට හේතු පරීක්ෂා කර බලා ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම්වල වටිනාකම රු.1,319,707,510 ක් වූ අතර, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආධාර මඟින් දායකවීමේ ගිණුමේ එකතුව රු.1,319,187,889 ක් වීමෙන් ගිණුම් ශේෂ දෙක අතර රු.519,621 ක වෙනසක් පැවතුණි. | නොසැසඳීම්වලට හේතු පරීක්ෂා කර බලා ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.23,691,740 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.224,181 ක වෙනසක් පැවතුණි. | නොසැසඳීම්වලට හේතු පරීක්ෂා කර බලා ඒවා නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කළ යුතු වීම. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුමේ දීර්ඝකාලීනව පවතින රු.15,382 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයට අදාළ කාරණය නිවැරදිව හඳුනාගැනීමට නොහැකි වීම හේතුවෙන් වසර ගණනාවක් නිරවුල් කිරීමට නොහැකිව පවතින අතර, තව දුරටත් පරීක්ෂා කරමින් පවතී. | මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.4 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනවසර ඉදිකිරීම් තහනම් කිරීම් හා පාරවල් සම්බන්ධයෙන් සභාවට එරෙහිව 2006 සිට 2020 දක්වා කාලය තුල නඩු 26 ක් පවරා තිබුණු අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | පරීක්ෂා කර බලා පසුව පිළිතුරු යොමු කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පරිහරණය කරන්නන්ට තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු අනාවරණය කළ යුතු වීම. |

### 1.6.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.43,604,843 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව තොග ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී එම තැන්පතු ලේඛන නිරවුල් කර ගැනීමට කටයුතු කරමි. | අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 126 (vii) (ඊ) වගන්තිය හා 2016 දෙසැම්බර් 13 දින ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍රය | වර්ෂය ආරම්භයේ දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් , 2020දෙසැම්බර් 31 දින වන විටත් එවැනි සමීක්ෂණයක් සිදු කර නොතිබීමෙන් දැන්වීම් පුවරු සඳහා ලැබිය යුතු රු.600,000 ක ආදායම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම වර්ෂයේ දී අභ්‍යාසලාභී පුහුණු නිලධාරීන් යෙදවීමට කටයුතු කර ඇත. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| | (ii) 149 වගන්තිය | කුණ්ඩසාලේ සහා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල් 14 කින් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායමින් සියයට 1 ක ගාස්තුව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 1982 අංක 4 හා 1984 අංක 44 දරන පනත් වලින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනතේ | අනුමැතියකින් තොරව අමුණුගම බස් නැවතුම්පොළ අසළ මාර්ග රක්ෂිතයද ආවරණය කර කඩ කාමර 5 කින් යුත් වාණිජ වෙළඳ | අදාළ පාර්ශවය වෙත එම ඉදිකිරීම කඩා ඉවත් කරන ලෙස දන්වා ලිඛිතව දැනුම් දී ඇත. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | 28(ආ)01 වගන්තිය | සංකීර්ණයක් පෞද්ගලික පාර්ශවයක් විසින් ඉදිකර තිබුණි. මෙම අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් සභාවේ නිලධාරීන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ඇ) | 2013 ජූලි 31 දිනැති අංක 07 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | ත්‍රීරෝද රථ නැවතුම්පලවල් 150 ක් ලියාපදිංචි කර තිබූ අතර ඉන් ත්‍රීරෝද රථ 1262 කින් අයවිය යුතු රු.601,200 ක ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ ත්‍රී රෝද රථ සමීක්ෂණය සහ හිග ගාස්තු අය කර ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.91,567,788 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,898,648 ක් විය. එයට ප්‍රධාන වශයෙන් සමාලෝචිත වර්ෂයේ සාමාන්‍ය පරිපාලන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 241 කින් වැඩිවී තිබීම බලපා තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.12,664,709 ක හිඟ වරිපනම් ශේෂයෙන් වර්ෂය තුළ රු.2,844,808 ක් හෙවත් සියයට 22 ක් පමණක් අයකරගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායමෙන් සියයට 49 ක් පමණක් අයකරගෙන තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවති රු.25,995,588 ක හිඟ වරිපනම් බදු මුදල තුළ රජයේ ආයතනවලින් වසර ගණනාවක සිට අයවිය යුතු රු.381,716 ක හිඟ වරිපනම් බදු මුදලක්ද ඇතුළත්ව තිබූ අතර එම හිඟ බදු අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.639,550 ක හිඟ කසළ බදු ශේෂයෙන් වර්ෂය තුළ රු.254,800 ක් හෙවත් සියයට 40 ක් පමණක් අයකර ගෙන තිබූ අතර, දෙසැම්බර් මස අවසානයට රු.769,500 ක හිඟයක් පැවතුණද එම හිඟ බදු අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි . | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | අක්කර බදු ඒකක 73 කින් 2020 දෙසැම්බර්31 දිනට අයවිය යුතු හිඟ අක්කර බදු ශේෂය රු.55,295 ක් තුළ රජයේ ආයතන 02 කින් අයවිය යුතු රු.10,002 ක් ද ඇතුළත් විය. | අය කර ගැනීමට නොහැකි අක්කර බදු ලේඛනවලින් කපා හැරීමටත් සෙසු හිග මුදල් අය කර ගැනීම සඳහා ආදායම් පරීක්ෂක වෙත අදාළ ලැයිස්තු ලබා දී ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කුලී<br>--------<br>මැණික්හින්න බස් නැවතුම්පල අසළ කඩ කාමර 03 කින්, මැණික්හින්න කිරිමැටිය හංදිය ඉහළ මහළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02 කින්, දිගන රණවිරු වීදියේ කඩ කාමර 59 කින්, බලගොල්ල මොරගහපිටිය බහුකාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර 51 කින්, පොල්ගොල්ල සර්වෝදය ගොඩනැගිල්ලෙහි එක් කඩ කාමරයකින් හා මැණික්හින්න පොදු වෙළඳපලෙහි කඩ කාමර 19 කින් සමාලෝචිත වර්ෂය සඳහා රු.780,994 ක මුදලක් අය විය යුතුව තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | වෙනත් ආදායම්<br>-------------------- | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.2,400,518 ක් වෙනත් ආදායම් හිඟයෙන් වර්ෂය තුළ රු.196,350 ක් එනම් සියයට 8 ක් පමණක් අයකර ගෙන තිබූ අතර වර්ෂයේ රු.263,000 ක බිල් කිරීම්වලින් රු.112,038 ක් එනම් සියයට 43 ක් පමණක් අය කිරීම හේතුවෙන් වර්ෂයේ අවසානයට සම්පූර්ණ හිඟය රු.2,359,131 ක් විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙලෙස ආදායම් රැස් කිරීම අවප්‍රමාණය වී ඇත. | නොපමාව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | පෞද්ගලික හෝටලයක් විසින් ව්‍යාජව සැකසූ ගිණුම් කට්ටලයක් මත 2015, 2016, 2017 වර්ෂවල රු.2,358,313 ක බදු මුදලක් ගෙවා තිබූ නමුත්, සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කළ ගිණුම් ප්‍රකාශනවලට අනුව රු.14,462,640 ක ආදායමක් අඩුවෙන් අයකර ඇති බව අනාවරණය වී | මේ වන විට නීතිඥ උපදෙස් ලබා ගනිමින් නඩු පැවරීමට පෙර අවසන් නිවේදන නිකුත් කිරීමට අදාළ ලේඛන සකස් කිරීමේ කාර්යය අවසන් | අදාළ වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට කටයුතු කිරීම හා ඒ අනුව අයවිය යුතු නියමිත බදු මුදල අයකර |

| | | |
|---|---|---|
| තිබියදීත් එම ආදායම අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණු අතර 2018, 2019 වර්ෂ සඳහා ද අදාළ ආයතනය විසින් සභාවට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | කරමින් පවතින බව දැනුම් දෙන අතර, 2019 සහ 2020 වර්ෂ සඳහා මේ වන විට නඩු පවරා ඇත. | ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.34,591,024 කලැබිය යුතු ගිණුම් ශේෂ තුළ වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ රු.27,135,598 කගිණුම් ශේෂ සහ එකතුව රු.155,532 ක වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ පැවතියද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි ටෙන්ඩර් ගාස්තු හා අගරු වෙක්පත් සම්බන්ධයෙන් පළාත් පාලන උපදෙස් අනුව කටයුතු කරන අතර කර්මාන්ත ණයගැතියන් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නොපමාව පියවීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ අයිතම 3 ක එකතු වටිනාකම රු.156,969,239 ක් වූ අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.23,331,564 ක් වුවද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර වර්ෂවල ශේෂ පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරමි. | නොපමාව පියවීමට කටයුතු කළයුතු වීම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් රජ රූප පොළ 2016 වර්ෂයේදී රු.9,080,564 ක පිරිවැයක් දරා ඉදිකර තිබූ අතර 2019 වර්ෂයේ රු.675,029 ක වියදමක් දරා වැසිකිළියක්ද ඉදිකර තිබුණි. ගොඩනැගිල්ල ඉදිකර වර්ෂ 05 ක් පමණ ගතවී තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. | ඉදිරියේ දී මෙම ස්ථානයෙන් ආදායම් උත්පාදන කටයුතු ආරම්භ කිරීමට හැකි වේ. | සභාව සතු සම්පත් උපරිම ඵලදායීත්වයක් ලැබෙන පරිදි කාර්යක්ෂමව උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බලගොල්ල මොරගහපිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයක් සහ බලගොල්ල මොරගහපිටිය වෙළඳ සංකීර්ණයේකඩ කාමර 05 ක් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කර නොතිබුණි. | මෙම කඩ කාමරවලට අදාළව බදු කරුවන් තෝරාගෙන ඇති අතර ඉදිරියේ දී ව්‍යාපාර කටයුතු සඳහා විවෘත කිරීමට කටයුතු කර ඇත. | බදු දීමේ කටයුතු කඩිනමින් නිම කර ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ හතරවන මහල රු.13,245,294 ක් වියදම් දරා ඉදිකර 2019 අප්‍රේල් 03 දින වැඩ අවසන්කර භාරදී තිබුණද විගණන දිනය වන 2020 දෙසැම්බර් 31 වන විටත් වර්ග මීටර 134 ක වපසරියක් සහිත සම්මන්ත්‍රණ ශාලාව භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ගොඩනැගිල්ල නිම කිරීමේදී අත්‍යාවශ්‍ය අංග වූ යකඩ අත්වාරු සහ අදාළ සනීපාරක්ෂක පහසුකම් භාවිතයට ගත හැකි ආකාරයෙන් සකස් කර නොතිබුණි. | සභා ගොඩනැගිල්ලේ පවතින අඩුපාඩු 2021 වර්ෂයේ ප්‍රතිපාදන මගින් පිළිසකර කිරීමට කටයුතු කර ඇත. | සභාව සතු සම්පත් උපරිම ඵලදායිත්වයෙන් ලබා ගැනීම සඳහා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට සැලැසුම් කිරීම. |
| (ආ) | අලුත්වත්ත කවෂිමා යාන්ත්‍රික කොම්පෝස්ට් අංගනය පුළුල් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීමේදී ඇස්තමේන්තු වටිනාකම වැඩි කර දැක්වීමෙන් වූ මූල්‍ය අලාභයත් පොළව ග්‍රැවල් යොදා තලා තිබියදී කම්බි යෙදීමේ අවශ්‍යතාවය තාක්ෂණිකව තහවුරු කිරීමකින් තොරව කම්බි යෙදීම සඳහා වැය කල රු.1,827,936 ක මුදලත් භූමියේ පස් ඉවත් කිරීම හා එය පිරවීම සඳහා අතිරේක වශයෙන් වැය කළ රු.5,309,574 මුදලත් පස් ප්‍රවාහනය සඳහා අනුමත රේටයන් දක්වා තිබියදී වෙනත් මිල විශ්ලේෂණයක් ඉදිරිපත් කර වැය කර තිබූ රු.1,121,849 ක මුදලත් අනුමත පිරිවිතරයට අනුව රේටයන් භාවිතා නොකර වැඩිපුර ගෙවා තිබූ රු.721,992 ක මුදලත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | (i) මෙම දැන්වීම නිවැරදි කිරීම කළ යුතු වුවද නැවත දැන්වීම පළ කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි.<br>(ii) JCB වැනි යන්ත්‍ර ධාවනය කරන බැවින් පොළව කොන්ක්‍රීට් කිරීමේදී කම්බි අතුරා කොන්ක්‍රීට් කිරීමට හේතුවිය. කොන්ක්‍රීට් ස්ථරයකට සම්පිණ්ඩන බලය දරා ගැනීමට හැකිවුවද ආතති බලය (TENSILE FORCE) දරා ගැනීමට නොහැකි අතර කම්බි ඇතිරීම මඟින් එම කාර්යය පරිපූර්ණ කරනු ඇත.<br>(iii) කසළ ස්ථරය මත ඉදිකිරීමක් කළ නොහැකි අතර එය නිවැරදි ප්‍රමිතියකින් කළ යුතු බැවින් එම ඉවත් කරන ලද කසල සඳහා ගුණාත්මක පස් පිරවීමට කටයුතු කර ඇත. | පෙන්වා දී ඇති අලාභ පිළිබඳව අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |